**සවියෙන් පෙරට අපි එකට**

e-ඉගෙනුම් පාසල

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂය | වාරය | පාඩම/ඒකකය/ක්‍රියාකාරකම Competency |
|---|---|---|---|
| 7 ශ්‍රේණිය | සිංහල | I වාරය | කතා බහට සංයමයක් - 8 පාඩම |
| | | | |
| සැකසුම-කේ.එම්.පී.ඉරෝෂා නිශාන්ති මිය කළුපහන කනිෂ්ඨ විද්‍යාලය | | | |

## කතා බහට සංයමයක්

**1.ඔබ දන්නෙහිද?**

සාමාන්‍ය කතා බහ පමණක් නොව සවන් දීම මගින් දැනුම අධ්‍යාපනය ලබා ගැනීම ද සිදු වෙයි. ලිවීම ප්‍රචලිත නොවූ පැරණි සමාජයේ අධ්‍යාපනය මුළුමනින්ම සවන් දීම මත රඳා පැවතිණි. එදා උගතා හැඳින්වීම සඳහා යෙදුණු "බහුශ්‍රැත" යන්නෙහි අරුත ද "බොහෝ ඇසූ" යන්නයි. අද ද උගතකු හැඳින්වීමට "බොහෝ ඇසූ පිරූ තැන් ඇති" යනුවෙන් ව්‍යවහාර කෙරේ.

**පාඩමෙන් අපේක්ෂිත නිපුණතාව :-**

සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායී ලෙස යොදා ගැනීම.

**නිපුණතා මට්ටම :-**

සවන් දී ප්‍රතිචාර දැක්වීමේ දී ආචාරශීලී බව හා සංයමය ප්‍රදර්ශනය කිරීම.

එකිනෙකා අතර ඇතිවන කතා බහේ දී හා සංවාදවල දී අවධානය මෙන්ම ආචාරශීලී වීම ද අවශ්‍ය ය. සවන් දීමේ පුරුද්ද කෙනෙකුගේ කථනය හැඩ ගන්වයි. එදිනෙදා ජීවිතයේ දී අපට විවිධ අය සමඟ කතාබහ කරන්නට සිදු වේ. එහි දී පුද්ගල විවිධත්වයට සහ ගැළපෙන ලෙස කතා බහ හා සවන් දීම සිදු කළ යුතු වේ.

**උදාහරණ :**

- ✶ භික්ෂුන් වහන්සේ / පූජකතුමන් සමඟ කරන කතා බහ
- ✶ ගුරුවරුන් සමඟ කතා බහ
- ✶ වැඩිහිටියන් සමඟ කතා බහ
- ✶ රජයේ / පුද්ගලික කාර්යාලයක නිලධාරීන් සමඟ කතා බහ

2.අපට අන්‍යයන්ගේ හැඟීම් ඔවුන් කරන කතා බහට ඇහුම්කම් දීමෙන් අවබෝධ කරගත හැකිය. කතාවකට සවන් දී ඊට ප්‍රතිචාර දැක්වීමේ දී අප තුළ ආචාරශීලී බව හා සංයමයක් පැවතීම අතිශය වැදගත් වේ.

- ✶ අවස්ථාවට උචිත ස්වරයක් (හඬක්) භාවිතා කිරීම
- ✶ අවස්ථාවන්ට හා පුද්ගලයන්ට ගැළපෙන වචන භාවිතය
- ✶ උචිත අංග චලන භාවිතය
- ✶ සංවර බව
- ✶ සවන් දුන් පසු ප්‍රතිචාර දැක්වීම

✶ කතාවට බාධා නොකිරීම

යමකට සවන් දී ඊට සුහදශීලී ලෙස හා ගෞරවනීය ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා මඟ පෙන්වන සංවාද හතරක් පාඩමට ඇතුළත් වේ.

## පළමු වැනි සංවාදය

ජපන් ජාතික ටෙට්සුකෝ කුරොයානගි ලියූ ලීලානන්ද ගමාච්චි මහතා පරිවර්තනය කළ "හරි පුදුම ඉස්කෝලේ" කෘතියේ ඇතුළත් කුඩා සංවාදශීලී දෙබසක් පළමු සංවාදයේ දක්වා ඇත. මෙය දඟකාර ජපන් දැරියක හා අසිරිමත් පාසලක් පිළිබඳව ලියැවුණු ජපන් ළමා කතාවක් වේ.

ස්ථානය : දුම්රිය නැවතුම් පොළ

**ටොට්ටෝ චං** : "මම මේක තියා ගන්නද?"

**ටිකට් පත් එකතු කරන්නා** : "බැහැ ඔයාට ඒක තියා ගන්න බැහැ"

**ටොට්ටෝ චං** : "මේ ඔක්කොම ඔයාගෙ ද?"

(ටිකට් පත් වලින් පිරුණු පෙට්ටිය දෙස බලමින් අසයි.)

**ටිකට් පත් එකතු කරන්නා** : "නෑ , නෑ , ඒවා අයිති දුම්රිය ස්ථානයට."

**ටොට්ටෝ චං** : "මං ලොකු වුණාම ටිකට් පත් එකතු කරන කෙනෙක් වෙනවා"

(ඈතින් නැවති සිටි මවට හඬ ගා කියයි.)

**මව** : "මං හිතුවෙ ඔයා ඔත්තුකාරියක් වෙන්න යනවා කියලා."


**ටොට්ටෝ චං** : "ඔත්තු බලන ගමන් ම ටිකට් විකුණන කෙනෙකුත් වෙන්න මට බැරිද?"

මෙම සංවාදයේ දී ටොට්ටෝ චං නමැති දැරිය ටිකට් පත් එකතු කරන්නා සමඟ කතා කළ ආකාරය සිත් ගන්නා සුලුය. එසේම දෙදෙනා එකිනෙකාට සාවධානව ඇහුම්කන් දීම සිදු කළ අතර මව ඔවුන්ගේ කතා බහට බාධා නොකර දෙදෙනාගේ සංවාදයට සවන් දී ප්‍රතිචාර දැක්වූ ආකාරය ඉතා සුහදශීලී භාවයෙන් ඉදිරිපත් කර තිබූ ආකාරය ආකර්ශනීයයි.



## දෙවැනි සංවාදය

ස්ථානය : නිමල්ගේ නිවස




"පුතා , උඹ යන්ට කැමති ද නුවර"

"නෑ"

"ඇයි"

"මට මෙහෙ හොඳයි"

"එහෙ ගියොත් සුදු අප්පොත් එක්ක සෙල්ලම් කරතෑකි"

"මෙහි හිටියොත් අප්පච්චිගෙ වැඩට උදවු කරන්ට පුළුවනි නොවැ"

"ඒකට කමක් නෑ. උඹ පලයන් නුවර. ගෙදර ගිහිල්ලා අම්මාට කියලා මොකක්වත් ඇඳ ගෙන කාරිය වරෙන්"

"කවදා ද අප්පච්චි මං ආයෙ එන්නේ"


"මැණිකෙලා කී දවසක වරෙන්"

"අප්පච්චි කියන්නේ මට යන්ට ම කියල ද?"

"ඔව්, ගිහින් වරෙන්. නැත්නම් කුමාරිහාමිලා තරහ වෙයි."

මෙම සංවාදය සකස් කර ඇත්තේ ටී.බී. ඉලංගරත්න මහතා විසින් රචිත "අඹ යහළුවෝ" නවකතාව ඇසුරිනි. නිමල් සහ පියා අතර ඇති වූ සංවාදයේ දී නිමල් පියා සමඟ කතාබහ කරන්නේ ඉතාම ගරුසරු ලෙසිනි. නිමල් නුවර යාමට අකමැති උව ද එය ප්‍රකාශ කරන්නේ බොහෝම ආචාරශීලී හා කරුණාවන්ත ලෙසය. කෝපය ප්‍රකාශ වීමක් ඒ තුළ නැත.

## තුන්වැනි සංවාදය




ස්ථානය : ගැමි නිවසක්

"අම්මේ , අපි ගිහින් එන්නම්"

"මගේ පුතාට තුනුරුවන් පිහිටයි"

"අක්කේ"

"මොකද මල්ලී , මොනවත් බැරි වුණා ද?"

"ඕක තමයි. මම ඊයේ රෑත් කිවුවේ , ගෙන යන ඒවා හොඳ සිහියෙන් දා ගන්න කියලා"

"නෑ මං කතා කළේ මල් පාත්තිය බලා ගන්න කියන්න"

"අක්කට බැරි නම් ලොකු නංගිටවත් කියලා වතුර දම්මවන්න ඕනෑ"

"නෑ මල්ලියෙ , මට පුළුවන් ඔය මල් පාත්තියට සාත්තු කරන්න."

මෙම සංවාදය සකස් කර ඇත්තේ මඩවල එස්. රත්නායක මහතාගේ "අක්කර පහ" කෘතියෙනි. සහෝදරයෙකු නිවසින් පිටව යද් දී අනෙක් සහෝදර සහෝදරියන් වගකීම භාර ගැනීමට ඉදිරිපත් වන අවස්ථාවකි. ඔවුන් අතර පවතින බැඳීම මත කෙනෙකු අනෙක් අය වෙනුවෙන් කටයුතු කරන්නට යොමුවන්නේ එම ඉල්ලීමෙහි පවතින කාරුණිකභාවය නිසාවෙනි. අණ කිරීමකට වඩා ඉල්ලීමකට ප්‍රතිචාර දක්වන්නට ඕනෑම අයෙකු කැමැත්තක් දක්වයි.

## හතරවන සංවාදය

**ස්ථානය : පන්සල**

**විහාරාධිපති ස්වාමීන් වහන්සේ :** "උපාසක මහත්තයෝ , අද බෝධි පූජාවේ ප්‍රධාන දායක තැන කවුද?"

**උපාසක තැන :** "අවසරයි , ලොකු හාමුදුරුවනේ , අද බෝධි පූජාව විදානෙ රාලහාමිගේ ගෙදරින්."

**විහාරාධිපති ස්වාමීන් වහන්සේ :** "විදානෙ රාලහාමි පැමිණිලාද?"

**උපාසක තැන :** "එහෙමයි හාමුදුරුවනේ. උන්නැහේ බෝධි පූජාවට ගිලන්පස සූදානම් කරනවා."

**විහාරාධිපති ස්වාමීන් වහන්සේ :** "ඒ කටයුතු අහවර වුණාම ආවාස ගෙට ඇවිත් මාව බැහැ දකින්ට කියනවා හොඳයි.පොඩි හාමුදුරුවෝ පූජාවට වඩියි."

**උපාසක තැන :** "එහෙමයි , අපේ හාමුදුරුවනේ. මට යන්ඩ අවසර"

**විහාරාධිපති ස්වාමීන් වහන්සේ :** "හොඳයි. ගොහින් එන්ඩ."

මෙම සංවාදය තුළ යොදාගෙන ඇති වාග්මාලාව , සාමාන්‍ය පුද්ගලයන් සමඟ කතා බහ කරද් දී යොදා නොගැනෙන ඉතාම සංවරව ආචාරශීලීව ගෞරවාන්විතව යොදා ගෙන ඇති සිත්ගන්නා වාග්මාලාවකි. කතා බහ කිරීමේ දී අනෙක් පුද්ගලයාට සවන් දීම ඔහුට කරන ලොකු ගෞරවයක් මෙන්ම සංවරව සංයමයෙන් කතා කිරීම තමන්ගේ හික්මුණු බව සහ යහපත් හැදියාව පෙන්වන කැඩපතක් බඳුය.



## ලිඛිත අභ්‍යාසය

01.රන්තරු ක්‍රීඩා සමාජයේ වාර්ෂික ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය සඳහා ප්‍රධාන ආරාධිතයා ලෙස ප්‍රාදේශීය ලේකම් තුමා සඳහා ආරාධනය කිරීමට ආරාධනා පත්‍රය ක්‍රීඩා සමාජයේ ලේකම්තුමා වන නන්දන මහතා විසින් ප්‍රාදේශීය ලේකම් තුමාගේ කාර්යාලයේ නිලකාමරයට රැගෙන ගොස් එතුමාට පිළිගන්වන අවස්ථාවට උචිත පරිදි සංවාදශීලී දෙබස් යොදා ගනිමින් සංවාදයක් සකස් කරන්න.

## අවබෝධය

පාඩමට අදාළ සංවාද හතර තවදුරටත් අධ්‍යනය කරමින් පහත දක්වා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට උත්සහ කරන්න.

01.දෙවන සංවාදයේ සඳහන් වන නිමල් පියා සමඟ ඉතා ආචාරශීලීව කතාබහ කළ බව දැක්වෙන ප්‍රකාශ මොනවා ද?

02.තුන්වන සංවාදයේ දී පවුලක සහෝදර සහෝදරියන් අතර පැවති බැඳීම අපට ඉස්මතු වන්නේ කවර ප්‍රකාශ නිසා ද?

03.දායක මහතා පන්සලේ දී ස්වාමීන් වහන්සේ සමඟ ඉතා සංවරව , ආචාරශීලීව ගෞරවාන්විතව කතා බහ කළ බව හා උන්වහන්සේ ඇහුම්කන් දුන් බව ඉස්මතු වන ස්ථාන මොනවාද?

04.කතා බහේ දී අප එකිනෙකාට කෙසේ සවන්දිය යුතු ද?

## ලිඛිත අභ්‍යාස 1 ප්‍රශ්නය සඳහා පිළිතුර

**ප්‍රාදේශීය ලේකම් :** එන්න වාඩි වෙන්න

**නන්දන මහතා :** සුබ උදෑසනක් වේවා! ලේකම්තුමනි, ඔබතුමාට
ආරාධනාවක් කිරීමට ආවේ. මම රන්තරු ක්‍රීඩා සමාජයේ ලේකම්

(ආරාධනා පත්‍රය පිළිගන්වමින්)

**ප්‍රාදේශීය ලේකම් :** මම දන්නවා රන්තරු ක්‍රීඩා සමාජය ගැන. ඉතින් මොකක් ද කාරණය ?

**නන්දන මහතා :** අපේ ක්‍රීඩා සමාජයේ ත්‍යාග හා සහතික පත්‍ර බෙදා දීමේ උත්සවය ලබන මාසේ 20 වැනිදා හවස දෙකටයි , උත්සවය සූදානම් කරලා තියෙන්නේ

**ප්‍රාදේශීය ලේකම් :** (දින පොත පෙරලා බලමින්) හා...... එදාට විශේෂ රාජකාරියක් යෙදී නැහැ. මට උත්සවයට එන්න පුළුවන්.

**නන්දන මහතා :** ඔබතුමාට බොහෝම ස්තූතියි!

## අවබෝධය ප්‍රශ්න සඳහා පිළිතුරු

1.“කවදා ද අප්පච්චි මං ආයෙ එන්නේ?”

“අප්පච්චි කියන්නේ මට යන්ටම කියල ද?”

2.“මොකද මල්ලී , මොනවත් බැරි වුණා ද?”

“නෑ මල්ලියෙ , මට පුළුවන් ඔය මල් පාත්තියට සාත්තු කරන්න.”

3.“අවසරයි , ලොකු හාමුදුරුවනේ , අද බෝධි පූජාව විදානෙ රාලහාමිගේ
ගෙදරින්.”

“එහෙමයි , අපේ හාමුදුරුවනේ. මට යන්ඩ අවසර”

“හොඳයි. ගොහින් එන්ඩ.”

4.ඉතා සාවධානව , ඉවසීමෙන් හා සංයමයෙන් යුතුව සවන්දිය යුතු වේ.